සිංහල පරිවර්තනය

# උතුරු පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් නැවත කැඳවීම - 2023

උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ 2023.09.08 වන දින දරණ අනුමැතිය පරිදි උතුරු පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින උතුරු පළාත් ආදායම් බදු කොමසාරිස් තනතුරට (පුරප්පාඩු සංඛ්‍යාව - 01) වත්මන් කාලය තුළ සේවයේ නියුතු (අයදුම්පත් භාරගන්නා අවසන් දින වනවිට විශ්‍රාම නොගැන්වූ) ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් බදු සේවයට අයත් සුදුසුකම් සපුරා තිබෙන නිලධරයන්ගෙන් හා පළාත් ආදායම් බදු සේවයට අයත් සුදුසුකම් සපුරා තිබෙන නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2018.01.01දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද පළාත් ආදායම් බදු සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නියම කර තිබෙන කොන්දේසීන්ට ද 2018.01.01 වන දින සිට ක්‍රියාත්මක වෙමින් පවතින සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ද, එම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා ඇති සංශෝධනයන්ට ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ හා 2013.07.03 වන දින දරණ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතන කාර්ය පටිපාටික සංග්‍රයට ද යනාදීන්ට අනුකූලව ද මෙම තනතුරට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

එමෙන්ම 2023.05.05 වන දිනැති පුවත්පත් නිවේදනය මඟින් ඉහත තනතුරු පුරප්පාඩුව සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්පත්‍ර යොමු කළ නිලධරයන් වත්මන් හි කැඳවා ඇති සුදුසුකම් සපුරා තිබේ නම් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය **2023.10.10** වේ.

**02. බඳවා ගැනීමට අදාළ සේවා කොන්දේසි :-**

2.1. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් හිමි තනතුරකි උතුරු පළාත් ආදායම් බදු සේවයට අදාළ මෙම තනතුරට අනුමත කරන ලද සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ රීතීන්ට යටත්ව සේවා කොන්දේසීන් අදාළ වේ.

2.2 මෙම තනතුරට පත්වන නිලධරයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

2.3 නිලධාරයා පළාත් ආදායම් බදු සේවයේ හෝ දේශීය ආදායම් බදු සේවයේ තනතුර ස්ථිර කර තිබිය යුතුයි.

2.4 ඉහත සඳහන් කර තිබෙන තනතුරට අයදුම් කරන නිලධරයන් එම ඉල්ලුම්පත්‍රය තම ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුයි.

**03. වැටුප් පරිමාණය :-**

2016/02/25 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට අනුකූලව. **SL 1 – 2016** යන වැටුප් පන්තියේ **රුපියල්. 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – රුපියල් 110,895/-** වේ.

04. **සුදුසුකම්** :-

4.1 මේ වනවිට සේවයේ නියුතු නිලධරයන්ට අදාළ බඳවා ගැනීමක් වන බැවින් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.2 ශ්‍රී ලංකාවෙ දේශිය ආදායම් බදු සේවයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ වසර පහක් (5) සම්පූර්ණ කර ඇති නිලධාරීන් හෝ ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් බදු සේවයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් තනතුරට වඩා ඉහළ පන්තියට අයත් දේශීය ආදායම් බදු සේවයට අයත් නිලධරයකු විය යුතුයි

**නැතිනම්**

පළාත් ආදායම් බදු සේවයට අයත් නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ වසර පහක් (5) සම්පූර්ණ කළ හෝ පළාත් ආදායම් බදු සේවයට අයත් නියෝජ්‍ය කොමසාරිස් තනතුරට වඩා ඉහළ පන්තියක හෝ ශ්‍රේණියකට අයත් පළාත් ආදායම් බදු සේවයට අයත් නිලධරයෙකු විය යුතුයි

4.3. නියමිත ශ්‍රේණියේ **2023.05.22** වැනි දින වනවිට ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිවිධාන යනාදීන්ට අනුකූලව අයදුම්කරුට ලැබිය යුතු වැටුප් වර්ධක සියල්ල උපයා තිබිය යුතු අතර නිලධරයාට විරුද්ධව විනය කටයුතු කිසිවක් ඉදිරිපත්වී නොතිබිය යුතුයි.

4.4 උතුරු පළාත හැර හැර වෙනත් පළාත්වල පළාත් ආදායම් බදු සේවයට අයත් හෝ දේශීය ආදායම් බදු සේවයට අයත් නිලධාරීන් තෝරාපත් කර ගන්නා විට උතුරු පළාත් සභාවට අදාළ වූ ආයතන කාර්ය පටිපාටික රීති සංග්‍රහයට අනුකූලව නිලධරයා එම පළාතෙන් මුදවා හැරිය යුතුයි.

05 **:- සාමාන්‍ය සුදුසුකම්**

නිවේදනය මඟින් කැඳවා තිබෙන තනතුරේ රාජකාරීන් ඉටු කිරීමට අවශ්‍ය ශාරීරික හා මානසික නිරෝගීත්වයක් නිලධරයාට තිබිය යුතුයි.

**06. බඳවා ගැනීමේ ක්‍රමය** :-

නිවේදනය පරිදි සුදුසුකම් සපුරා තිබෙන දේශීය ආදායම් බදු සේවයට අයත් හා පළාත් ආදායම් බදු සේවය අයත් අයදුම්කරුවන් අතර උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට නියමිත වන අතර එම ව්‍යුහතගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ඉහළ ලකුණු අනුපිළිවෙළ අනුව සුදුසුකම් ලබන අයදුම්කරු මෙම තනතුරට පත් කරනු ලැබේ.

6.1. උතුරු පළාත් ආදායම් බදු කොමසාරිස් තනතුරට අනුමත කර බලගැන්වී තිබෙන සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එම සංශෝධනයන්ට අනුකූලව ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, ආයතන සංග්‍රහය, උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් කාර්ය පටිපාටික රීති සංග්‍රහය, පළාත් ප්‍රතිපත්තීන් හා නිවේදනයේ විධිවිධානයන්ට අනුකූලව ද මෙම බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. එමෙන්ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා අයදුම්කරුවන් කැඳවන අතර මෙම තනතුරු නිවේදනයට අදාළව කැඳවා ඇති සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බවට දැනුවත් වනවිට අපේක්ෂකත්වය අහෝසි කරනු ලැබේ.

6.2. සියළුම අයදුම්පත් **2023.05.22වන** දිනට ප්‍රථම තනතුරට අදාළවූ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතරම, සම්පූර්ණ නොකරන ලද දත්ත හා සුදුසුකම් සපුරා නැති අයදුම්පත් පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.3. උතුරු පළාත් ආදායම් බදු කොමසාරිස් තනතුරට අනුමත කරන ලද සේවක සංඛ්‍යාවෙහි 2023.05.22වන දිනට පවතින පරිදි පුරප්පාඩුව (01) සඳහා නිලධාරියා පත් කරනු ලැබේ.

6.4 තම සුදුසුකම් සහතික කරන සියළුම ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුයි. එසේ ඉදිරිපත් නොකරන ලිපිලේඛන සම්බන්ධයෙන් කිසිදු හේතුවක් නිසා හෝ පසුවට සැළකිල්ලට ගනු නොලැබේ.

**07. අසත්‍ය තොරතුරු සඳහා වූ දඬුවම :-**

අයදුම්පත් සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. (මෙම ව්‍යුහාතගත සම්මුඛ පරීක්ෂණ රීතීන්ට අනුකූලව,) අයදුම්කරුවන්ගෙන් කවරෙක් හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී හෝ ඉන් පසුව හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වන විට, අයදුම්කරුගේ අපේක්ෂකත්වය සඳහා වූ හිමිකම අහෝසි කරනු ලැබේ. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන යම්කිසි තොරතුරක් අසත්‍ය බවට අනාවරණය වන කුමක් හෝ අවස්ථාවක් වේද පළාත් රාජ්‍ය සේවයෙන් එම නිලධරයා ඉවත් කරනු ලැබේ.

**08. අයදුම්කරන ක්‍රමය :-**

8.1. මෙම නිවේදනය සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය තම අත්අකුරු වලින් සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුයි.

8.2. ඉහත පරිදි අදාළ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා විධිමත් පරිදි සම්පූර්ණ නොකරන ලද, සම්පූර්ණ නොවූ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිවැරදි ලෙස සම්පූර්ණ කිරීමට අපොහොසත් වීමෙන් අත්වන ප්‍රතිවිපාකයන් සඳහා වගකිව යුත්තේ අයදුම්කරුවන්ම වන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පතක පිටපතක් තමන් ළඟ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත මෙම නිවේදනයට අනුකූලව තිබෙන බවට අයදුම්කරුවන්ම සහතික විය යුතුයි. එසේ නොවන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3. අයදුම්පත් යොමු කරන ලිපිකවරයේ උඩවම් කෙළවරේ **"උතුරු පළාත් ආදායම් බදු කොමසාරිස්, තනතුරු පුරප්පාඩු පිරවීම – 2023"** යනුවෙන් සටහන් කර යොමු කරන්න.

8.4. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.10.10 වන දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලියාපදිංචි තැපෑලෙන් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට යොමු කළ යුතුයි. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**09.** අයදුම්කරුගේ අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලිපිලේඛන වලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය

(iii) වලංගු රියදුරු බලපත්‍රය

10. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශිත ලකුණු ප්‍රදානය කරනු ලැබේ. - **(සම්පූර්ණ ලකුණු 100)**

| අංක | ලකුණු ප්‍රදානය කරන විෂය පථයන් | උපරිම ලකුණු |
|---|---|---|
| **01. සේවා ජ්‍යෙෂ්ඨතාවය** | | |
| 01.1 | a. පළාත් ආදායම් බදු සේවයට අයත් නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ සතුටුදායක හා සක්‍රිය සේවා කාලය වසර පහ සම්පූර්ණ කිරීමෙන් පසුව පැමිණෙන සතුටුදායක හා සක්‍රිය සේවා කාලය සඳහා සෑම සම්පූර්ණ වර්ෂයක් සඳහා ලකුණු 08 බැගින් (උපරිම වසර 05ක්).<br><br>b. ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් බදු සේවයට අයත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් තනතුර හෝ එම තනතුරට වඩා ඉහළ තනතුරක හා පළාත් ආදායම් බදු සේවයට අයත් නියෝජ්‍ය කොමසාරින් තනතුරට වඩා ඉහළ තනතුරක් සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර වසර පහකින් පසුව ද සම්පූර්ණ කරන ලද සතුටුදායක හා සක්‍රිය සේවා කාලය වන සම්පූර්ණ වර්ෂයක් සඳහා ලකුණු දහය බැගින්. ( උපරිම වසර 05ක් )<br><br>සටහන :<br>(01.1 හි ජේද a හෝ ජේද b, හෝ දෙකේම එකතුව වශයෙන් උපරිම ලකුණු ප්‍රමාණය 50ක් ප්‍රදානය කරනු ලැබේ | 50 |
| 01.2 | පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැඩ බලන කොමසාරිස් තනතුර හෝ ඊට ඉහළ තනතුරක සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් සඳහා එක් වසරකට ලකුණු 2 බැගින්. | 08 |
| **02. වෘත්තීය සුදුසුකම්** | | |
| 02.1 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයකින් බදු පැනවීමේ කළමනාකරණය, නීතිය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික, ව්‍යාපාර, ගිණුම්කරණය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයයන් ගෙන් ලබාගත් පශ්චාත් උපාධිය සඳහා ලකුණු 06 බැගින්. | 12 |
| 02.2 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරන ආයතනයකින් බදු පැනවීමේ කළමනාකරණය, නිතිමය ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර හෝ ව්‍යාපාර සම්බන්ධ විෂයයන්ගෙන් ලබා ගත් පශ්චාත් ඩිප්ලෝමා සඳහා ලකුණු 04 බැගින් (පශ්චාත් ඩිප්ලෝමා, පශ්චාත් උපාධිය දෙකම එකම විෂයයන් ගෙන් යෙදී තිබෙන අවස්ථාවේදී පශ්චාත් උපාධියට ලකුණු ප්‍රදානය කරනු ලැබේ) | 08 |
| 02.3 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරන ආයතනයකින් අවුරුද්දකට නො අඩු ඉංග්‍රීසි භාෂාව සබැඳි පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. | 02 |

| | | |
|---|---|---|
| 02.4 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරන ආයතනයකින් අවුරුද්දකට නො අඩු පරිගණකය සබැඳි පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. | **02** |
| **03** | **සාමාන්‍ය කරුණු** | |
| **03** | ආදායම් බදු සම්බන්ධ ක්‍රියාවලිය සඳහා දේශීය වශයෙන් ලබාගත් සම්මාන, විශේෂ ව්‍යාපෘතීන්, ලිපි ප්‍රකාශන හෝ පළාත් ආදායම් බදු නීතිය හා භාවිතය සම්බන්ධයෙන් ප්‍රකාශන කරන ලද පොත් මෙම ක්‍රියාවලියන්ගෙන් එක් ක්‍රියාවලියට ලකුණු 04 බැගින් | **08** |
| **04** | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා** | . |
| 04.1 | නායකත්වය (Leadership) | **05** |
| 04.2 | සන්නිවේදන කුසලතා (Communication Skill) | **05** |
| | **සම්පූර්ණ එකතුව** | **ලකුණු 100** |

11. සටහන :- මෙම නිවේදනයේ දෙමළ හා සිංහල භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් දක්නට ලැබෙන අවස්ථාවක් උදා වුවහොත් දෙමළ භාෂා මාධ්‍යයේ සඳහන් කරුණු අදාළ වෙන අතර. මෙම නිවේදනය මගින් විධිවිධාන සලසා නැති කරුණු සම්බන්ධයෙන් ද උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වේ. ඉහත කරුණු සම්බන්ධයෙන් යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍ය බව අපේක්ෂා කරන විට, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ 021 - 221 9980 යන දුරකථන අංකයට අමතා විමසිය හැකිය

***සි තිරුවාකරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
2023.09.25